# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
## පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය
## ණයවර අංකය : 5792 - LK
## ව්‍යාපෘති අංකය : P 156021
## අභිලාශය ප්‍රකාශ කිරීමේ ඉල්ලීම (REoI)

# ඒක පුද්ගල උපදේශන සේවා ලබාගැනීම - සිවිල් ඉංජිනේරු
# (පූර්ණ කාලීන උපදේශයන පදනම)

ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ඍජු අධීක්ෂණය යටතේ සිවිල් ඉංජිනේරුවරයෙකු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා බඳවා ගැනීමට සැලසුම් කර තිබේ. මේ යටතේ බඳවා ගන්නා උපදේශකවරයා විසින් ESCAMP ව්‍යාපෘතිය යටතේ යෝජිත ක්‍රියාකාරකම් වලට අදාළව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදිකිරීම් නැවත ප්‍රතිසංස්කරණය කිරීම, යටිතල පහසුකම් තැංවීම කෙරෙහි ඉංජිනේරුමය උපදේශන දයකත්වය ලබාදීම අපේක්ෂා කරයි.

අදාළ උපදේශකයා අවම වශයෙන් පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සපුරාලිය යුතුය.

**සිවිල් ඉංජිනේරු - තනතුරු 01**

**වැඩ විස්තරය :**

a. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල අවශ්‍යතාවයන්ට අනුව යටිතල පහසුකම් සඳහා සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම.

b. පිරිවිතර සැකසීම, පිරිවැය ඇස්තමේන්තු සැකසීම, ඉංජිනේරුමය නිර්මාණ සැකසීම, ලංසු පත්‍රිකා සැකසීමේදී අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීම හා අවශ්‍ය පරිදි ලංසු පත්‍රිකා සැකසීම.

c. ඉදිකිරීම් අධීක්ෂණය, කොන්ත්‍රාත් පරිපාලනය සහ ප්‍රගති සමාලෝචනය, සිවිල් කොන්ත්‍රාත් වැඩ පිළිබඳ වාර්තා සැපයීම.

d. ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලට අදළ ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහය වීම.

e. ව්‍යාපෘතියේ අනෙකුත් ඉංජිනේරුවන් හා තාක්ෂණික නිලධාරීන් හට සහය වීම

f. ව්‍යාපෘතියේ සියලුම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන් අධීක්ෂණය කිරීම.

g. මීට අමතරව ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකවරයා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන්

**සුදුසුකම් හා අත්දැකීම් :**

a. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ උපාධියක් හෝ පිළිගත් වෘත්තීය අධ්‍යාපන ආයතනයකින් ලබාගන්නා ලද සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපනික සුදුසුකම්

සහ

b. අවම වශයෙන් වසර 08 ක සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉදිකිරීම් හා ඉදිකිරීම් අධීක්ෂණය සම්බන්ධ පළපුරුද්ද (විශේෂයෙන් ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳව)

c. විදේශ ආධාර සපයන ව්‍යාපෘතීන් හී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් අත්දැකීම් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් හිමි වනු ඇත.

**වැටුප් පරිමාණය** : සුදුසුකම් සහ අත්දකීම් මත සාකච්ඡා කොට තීරණය කෙරෙනු ඇත.

**තෝරා ගැනීමේ නිර්ණායක** : අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද පදනම් කොටගත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරෙයි. විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් හී පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සලකනු ඇත.

ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය, රජයේ රෙගුලාසි, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ පරිගණක සාක්ෂරතාව පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය සුදුසුකම් වේ. ආරම්භක කොන්ත්‍රාත් කාලය වසරක් සඳහා වන අතර කාර්ය සාධනයට අදළව එම කාලය දීර්ඝ කෙරේ.

ලෝක බැංකුවේ උපදේශන සේවා සැපයීමේ මාර්ගෝපදේශ සංග්‍රහය : ලෝක බැංකුව විසින් අරමුදල් සැපයෙන ආයතනවල උපදේශන සේවා සැපයීම : ජනවාරි 2011 ජූලි 2014 (සංශෝධිත) අනුකූලව උපදේශකවරුන් තෝරා ගැනීම සිදු කෙරෙයි.

මේ සඳහා අදළ සවිස්තරාත්මක යොමු කිරීම අනුදේශ (Terms of Reference - TOR) පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතියේ වෙබ් අඩවියෙන් www.escamp.lk ලබා ගත හැක.

**අයදුම් කිරීම** : පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය විසින් සුදුසුකම් සහිත පුද්ගලයින්ගෙන් ඉහත දක්වා ඇති තනතුර සඳහා අභිලාශය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. ඒ සඳහා උනන්දුවක් දක්වන ඉල්ලුම්කරුවන් මෙම තනතුරට අදළ යොමු කිරීම් තම ජීව දත්ත පත්‍රිකාව මගින් (සුදුසුකම් හා පළපුරුද්ද මීට සමාන පැවරුම් සඳහා අදළ විස්තර කුසලතාවයන්ද ඇතුළත්ව) ඉදිරිපත් කළ යුතුය. රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් අදළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

මේ සඳහා ඉල්ලුම් කිරීමට උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට මේ සම්බන්ධ වැඩිදුර විස්තර පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා කාර්යාලීය දිනයන් හී දී නොවැම්බර් 26 වැනි දින සිට පහත දක්වා ඇති දුරකථන අංක හෝ ඊ-තැපැල ඔස්සේ ලබාගැනීමට හැකිය. අයදුම්කරුවන් විසින් තම අයදුම්පත්‍ර දෙසැම්බර් 07 වන දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ලිපිනයට යොමු කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, සම්පත්පාය, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**
**දුරකථන : 0094-112-888428, ෆැක්ස් : 0094-112-888577,**
**වෙබ් අඩවිය : www.escamp.lk**
**නොවැම්බර් 24, 2018**